2013.06.

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
සහකාර සමෘද්ධි කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ,
ප්‍රාදේශීය ලේකම්/ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිළධාරි,
කුරුණෑගල / පුත්තලම / කෑගල්ල දිස්ත්‍රික්කය.

**<u>දැයට කිරුළ 2014 - ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව</u>**
**<u>"ඉසුරුමත් නිවහනක්" සමාජ හා ජීවනෝපාය සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම.</u>**

2014 දැයට කිරුළ ජාතික වැඩසටහනෙහි ප්‍රධාන අංගය ලෙස මෙවර සියළුම ග්‍රාම සේවා නිලධාරි වසම් මූලික කර ගනිමින් ජනතාවට වඩා සමීප වන ආකාරයේ වැඩසටහනක් බවට පත් කර ගැනීම තුළින්, ඔවුන්ට රජයෙන් ලබාදෙනු ලබන ප්‍රතිලාභ හා සේවාවන් ග්‍රාම සේවා වසම් මට්ටමේ ජංගම සේවාවක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු මෙම දිස්ත්‍රික්කවල මැති ඇමතිතුමන්ලා තීරණය කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

02. 2013 ජුලි මස 01 දින සිට සෑම ග්‍රාම නිළධාරි වසමකම එක් සුහද ජනතා හමුවක් සමඟ ජංගම සේවාවක් පැවැත්වීමට නියමිත අතර අදාළ සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරින් ඒ සඳහා සහභාගී කළ යුතුවේ. ප්‍රතිලාභින්ගේ ප්‍රශ්න හඳුනා ගැනිම සඳහා අදාළ ආකෘති පත්‍ර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදීමට නියමිතව ඇත.

03. තවද අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2012 වසරේ දැයට කිරුළට සමගාමීව නිවාස වැඩසටහන ක්‍රියාත්මක කළ ආකාරයටම මෙවරද ඉසුරුමත් නිවහනක් ලබාදීමට මෙම නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. එහිදී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි වෙනත් දිස්ත්‍රික්කවල නිළධාරි කණ්ඩායම් අනුයුක්ත කරනු ඇත.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අනුයුක්ත කර ඇති නිළධාරින් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළම සුදුසු ස්ථානවල නේවාසිකවී වසම් මට්ටමින් ප්‍රතිලාභීන් හමුවී නිවාස පරීක්ෂා කර පහත වර්ගීකරණය අනුව අවශ්‍ය පහසුකම් ලබාදීමට මැදිහත් විය යුතු අතර එම වර්ගීකරණයට අනුව තෝරා ගත් නිවාස ප්‍රමාණයන් මීට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශයට යොමු කළ යුතුවේ. මෙම නිවාස වර්ගීකරණය හා තෝරා ගැනීමේදී ග්‍රාමීය කමිටුවක් මගින් හදුනා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. තවද එම නාම ලේඛණ හා විස්තර ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටද ඉදිරිපත් කළ යුතුය.

නිවාසලාභීන් හදුනා ගැනිම

i අදියර - සමෘද්ධිලාභි/අඩු ආදායම්ලාභි පවුල් අතරින් **උළු සෙවිලි කිරිම සඳහා පමණක් උපරිමය රුපියල් 25,000/-**

මේ යටතේ හදුනා ගන්නා පවුල් සඳහා එක් නිවසකට උළු කැට 1000ක් ලබා දීමට අපේක්ෂිතය.

ඇමුණුම් අංක 01 ආකෘති පත්‍රය.

ii අදියර - සමෘද්ධිලාභි/අඩු ආදායම්ලාභි පවුල් අතරින් වහලය සකසා උළු සෙවිලි කිරිමට ඇති නිවාස සඳහා . **උපරිමය රුපියල් 45,000/- කි.**

ඇමුණුම් අංක 02 ආකෘති පත්‍රය.

iii අදියර - සමෘද්ධිලාභි/අඩු ආදායම්ලාභි පවුල් අතරින් බිත්ති බැද වහලය සකස් කර උළු සෙවිලි කිරිමට ඇති නිවාස සඳහා . **උපරිමය රුපියල් 55,000/- කි.**

ඇමුණුම් අංක 03 ආකෘති පත්‍රය.

Iv අදියර - කිසිවෙකුගේ උදවු උපකාර නොමැතිව අනිවාර්යෙන්ම පිහිට විය යුතු පවුල් සඳහා නිවාස ඉදිකිරිම. **රුපියල් 60,000** සිට **100,000/- දක්වා**

ඇමුණුම් අංක 04 ආකෘතිපත්‍රය.

- අඩි 03 x 04 ප්‍රමාණයේ ජල මුද්‍රිත වැසිකිළියක් සැකසීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමට උපරිමය රු. 12,000/- කි. පහත සඳහන් කටයුතුවලට එම මුදල ලබාදිය හැකිය.
  - වැසිකිලි පෝච්චිය - බට
  - සිමෙන්ති
  - ගඩොල් /වැලි / කොන්ක්‍රීට් ගල්
  - වහල
  - පුහුණු ශ්‍රමය

මේ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ඒ ඒ වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දළ ඇස්තමේන්තුවක් 2013.07.15 වන විට සකස් කළ හැකි වන අතර, ප්‍රමුඛතාවය මත ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙනු ඇත.

අදාළ දිස්ත්‍රික්කයේ රාජකාරිවල නියුතු නිළධාරින්ට හා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලට සහයක් වන ලෙස කටයුතු කිරිම මෙම වැඩසටහනට සම්බන්ධ වන නිළධාරින්ගේ ප්‍රධාන වගකිම වේ. ඔවුන්ට අවශ්‍ය නවාතැන්, ආහාර පහසුකම් ලබාදිම ඒ ඒ කොට්ඨාශවල සිටින නිළධාරින්ගේ වගකිම වේ. එසේ අපහසුවන අවස්ථාවලදී පමණක් මහා සංගම් හා ප්‍රධාන කාර්යාලය මගින් පහසුකම් ලබා ගැනිමට උපදෙස් ලබා දී ඇත.

05. විශේෂයෙන් මෙම නිවාසලාභීන් හඳුනා ගැනිමේදී ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති 2012 වර්ෂයේ සංඛ්‍යා දත්ත පදනම් කරගෙන කටයුතු කිරිම අනිවාර්ය වේ. තම දිස්ත්‍රික්කයට අදාළ සංඛ්‍යා ලේඛන තොරතුරු අදාළ දිස්ත්‍රික්කයේ නිලධාරින්ට ලබාදීම දිස්ත්‍රික් භාර නිලධාරින් විසින් කළ යුතු වේ. මෙහිදී උපරිමය රුපියල් 100,000/- දක්වා දිරිය පියස නිවාස ක්‍රමය මෙන් නිවාස සංවර්ධන අවශ්‍යතාව මත මුදල් නිදහස් කිරිමට හැකියාව ඇති අතර මෙම වැඩසටහන යටතේ ඉදි වෙන සෑම නිවසකටම අනිවාර්යයෙන්ම වැසිකිලියක් නොමැති නම් වැසිකිලියක් ලබාදිම සඳහාද කටයුතු කළ යුතු අතර ඒ සඳහා රු. 12,000/- ක් හා විදුලි අත්වැල යටතේ විදුලිය ලබාදිමටද කටයුතු කළ යුතුවේ.

06. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සමෘද්ධි අධිකාරියට ලබා දෙන මුදල්වලට අමතරව ඒ ඒ සමෘද්ධි කලාපයට අවශ්‍ය අරමුදල් ලබා දී ඇති උපදෙස් හා චක්‍රලේඛවලට අනුව සමෘද්ධි මහා සංගම් බැංකු සංගම් පොදු සුභසාධන අරමුදල, සමෘද්ධි සමිති, සමෘද්ධි බලකායන් හා සමාජ සංවර්ධන පදනමින් ලබා ගත හැකිය.තවද සමෘද්ධි බැංකු සංගම් මගින් ලබාදෙන පොලී රහිත හා 10% සහන පොලී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය.

07. මීට අමතරව දැයට කිරුළ වැඩසටහනට සමගාමීව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආගමික හා සදාචාර සංවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදිම්, පාසල් යන වයසේ එහෙත් පාසැල් නොයන දරුවන් පාසල් ගත කිරිම් වැනි වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතුය. මේවා වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරිමට සුදුසු වැඩ පිළිවෙලක් සකසා ගත යුතු අතර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය මීට මැදිහත් වනු ඇත. දිස්ත්‍රික් කාර්යාලය විසින් ගම් මට්ටමට සකස් කරන ලද එම වැඩසටහන ප්‍රධාන කාර්යාලයට කඩිනමින් ලබාදිය යුතුය.

08. දැයට කිරුළ වැඩසටහනට සමගාමීව ඔබ දිස්ත්‍රික්කයේ රටවිරු නිවාස වැඩසටහන යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහාය ඇතිව තෝරා ගත් නිවාස ලාභීන් සඳහාද බැංකු ණය නිකුත් කිරීමේ කටයුතුද ආරම්භ කර එම නිවාස ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළයුතු වේ.

09. තවද අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා කෘෂි සත්ව පාලන ධීවර හා කර්මාන්ත කටයුතු අලෙවි සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම උපකරණ ලබාදීම හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ද මීට සමගාමීව ඒ ඒ කොට්ඨාශවල ක්‍රියාත්මක කළයුතුය. මේ සඳහා සමෘද්ධි බැංකු සංගම් 8 % ණය යෝජනා ක්‍රමය හා 5% චක්‍රීය අරමුදල භාවිතා කළ හැකි වේ. අදාල චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුවේ.

10. ඉහත දක්වන ලද සියලු වැඩසටහන් 2014 ජනවාරි 31 වන විට අවසන් කළයුතු වේ. එබැවින් හැකි ඉක්මණින් වැඩසටහන් සංවිධානය කර දියත් කිරිමට කටයුතු කළයුතු වේ. එහිදී මෙම වැඩසටහන් සහකාර සමෘද්ධි කොමසාරිස්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරිගේ මෙහෙයවීමෙන් මහා සංගම් අධ්‍යක්ෂ, මුලස්ථාන/ව්‍යාපෘති/කලාප කළමණාකරු, දිස්ත්‍රික් විෂය කළමණාකරු සමාජ සංවර්ධන සහකාර ඇතුළු නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ දියත් කළයුතුය. මේ සඳහා සියළුම සංවර්ධන නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයත්, ග්‍රාමීය සමෘද්ධි සමිති, බලකා, පාලක මණ්ඩල විධායක සභිකවරුන්ගේ සහාය ලබා ගැනීමටද ක්‍රියා කළයුතුය.

11. සියළුම වසම් භාර සමෘද්ධි නිලධාරින් ඒ ඒ වසම්වල ජංගම සේවාවන් සංවිධානය කිරීමට සහාය දිය යුතු අතර මුළු කාලය අතරතුර එම සේවාවන් ලබාදීමට අදාළ සියළු නිලධාරින් හා ප්‍රජාව මනාව සම්බන්ධීකරණය කර ප්‍රගති වාර්තා නිසි පරිදි කඩිනමින් ලබාදීමට ක්‍රියා කළයුතුය.

12. අඩු ආදායම්ලාභින්ගේ හා සමෘද්ධිලාභින්ගේ ජීවන මට්ටම උසස් කර ඔවුන් දිළිඳුකමින් මුදා ගැනීම තුළින් දැයට කිරුළ - 2014 වැඩසටහන සාර්ථක කිරීමට ඔබ සැම ලබාදෙන දායකත්වය අගය කරමි.

**ආර්.පී.බන්දුල තිලකසිරි,**

**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත් :-

| | | |
|---|---|---|
| 01. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා | - | කා.දැ.ගැ.ස. |
| 02. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා | - | කා.දැ.ගැ.ස. |
| 03. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා | - | කා.දැ.ගැ.ස. |
| 04. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු මුත්තු සිවලිංගම් මැතිතුමා | - | කා.දැ.ගැ.ස. |
| 05. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ල මැතිතුමා | - | කා.දැ.ගැ.ස. |
| 06. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | අ.ක.ස. |
| 07.අතිරේක ලේකම් (ග්‍රාමීය ආර්ථික), ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | අ.ක.ස. |
| 08. අතිරේක ලේකම් (සංවර්ධන), ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | අ.ක.ස. |
| 09. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - | අ.ක.ස. |
| 10. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක. | - | අ.ක.ස. |